# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1777/17 - 2012 සැප්තැම්බර් මස 25 වැනි අඟහරුවාදා - 2012.09.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### විශේෂ නිවේදනය

### කොළඹ මහා නගර සභාව

### නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුව

***පිටකොටුව හා කොටුව ප්‍රදේශයේ පදික වෙළඳාම්වල නියුතුව සිටි වෙළෙන්දන් හා නගර සංවර්ධන කටයුතු නිසා වෙළඳාම් කරන ස්ථාන අහිමි වූ පදික වෙළඳුන්ට විකල්ප ස්ථාන ලබා දීම***

පිටකොටුව හා කොටුව ප්‍රදේශයේ පදික වෙළඳාම් වල නියුතුව සිටි වෙළෙන්දන් හා නගරයේ සංවර්ධන කටයුතු නිසා වෙළඳාම් කරන ස්ථාන අහිමි වූ පදික වෙළඳුන්ට විකල්ප ස්ථාන ලබා දී සහන සැලසීමේ වැඩ පිළිවෙලක් කොළඹ මහා නගර සභාව විසින් ආරම්භ කර ඇත.

අදාළ වෙළඳුන් විසින් නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුවේ ආදායම් අංශයෙන් අයදුම්පතක් ලබාගෙන තමා ලඟ ඇති ලේඛන ගත සාක්ෂිද සමඟ නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) වෙත ඉදිරිපත් කල යුතු ය. අයදුම්පත් නිකුත් කිරීම ආරම්භ වන දිනය 2012.09.27 වෙනිදා වන අතර අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2012.10.15 වෙනි දින වේ. 2012.10.15 දිනෙන් පසු කිසිදු හේතුවක් නිසාවත් අයදුම්පත් භාර නොගන්නා බව කාරුණිකව දන්වන අතර මේ සම්බන්ධ උනන්දුවක් දක්වන වෙළඳුන් අදාළ දිනට පෙර අයදුම්පත් ඉදිරිපත් කල යුතුය.

නාගරික කොමසාරිස්,
කොළඹ මහා නගර සභාව.

10 - 439